# දියයට පවතින සංස්කෘතික හා ස්වභාවික උරුමයන් සංචාරකයන්ට ප්‍රවර්ධනය කිරීම

(ශ්‍රී ලංකාවේ උතුර, නැගෙනහිර සහ දකුණ යන ප්‍රදේශයන්හී දියයට පවතින සංස්කෘතික හා ස්වභාවික උරුමයන් සංචාරකයන්ට ප්‍රවර්ධනය කිරීම පිළිබඳ විමසුමක්)

එස්.වී. අපොන්සු

සංචරණය හා සංස්කෘතික සම්පත් කළමනාකරණය, පුරාවිද්‍යා අධ්‍යනාංශය, කැලණිය විශ්වවිද්‍යාලය. sumedaviraj1@gmail.com

**ප්‍රමුඛ පදː** දියයට උරුමයන්, කිමිදුම් සංචරණය, ප්‍රවර්ධනය, ආකර්ෂණ, සංචාරකයන්

## හැඳින්වීම

ශ්‍රී ලංකාව වටා පවතින වෙරළ තීරයේ හිරු රැස් විඳීමට අතීතයේ පැමිණි සංචාරකයන් එ වැනි සාම්ප්‍රදායික අරමුණු අභිබවමින් වර්තමානයේ දියයට පවතින උරුමයන් දැකබලා ගැනීමේ අරමුණින් සංචාරය කරනු දක්නට ලැබේ. ලංකාව තුළ දැනට පවත්නා සංචාරක ක්‍රියාකාරකම් අතර ත්‍රාසජනක සංචාරක ක්‍රියාකාරකම් අතර වැඩි ආකර්ෂණයක් දිනාගෙන ඇති ක්‍රියාකාරකමක් ලෙස කිමිදීම හෙවත් කිමිදුම් සංචරණය වැදගත් වේ. ලංකාව තුළ කිමිදීම සඳහා යෝග්‍ය වන ස්ථාන රැසක් පිහිටා ඇති අතර මෙම අධ්‍යයනයේ දී අවධානය යොමු කරනුයේ එම ස්ථාන අතරින් ලංකාවේ උතුර, නැගෙනහිර සහ දකුණ යන මුහුදු තීරයන් හි සංචාරකයන් සඳහා කිමිදුම් සංචරණය ප්‍රවර්ධනය කරන්නේ කෙසේ ද යන ආකාරය පිළිබඳව ය. මෙම ප්‍රදේශ ආශ්‍රිත දැනට ද කිමිදුම් කටයුතු සිදු කෙරුණ ද තවමත් මහා පරිමාණ ආකාරයෙන් සංචාරකයන් අතර ව්‍යාප්ත වී නොමැත. එම නිසා මෙම කටයුතු තව තවත් ක්‍රමානුකූල ආකාරයෙන් සිදු කළ යුතු ආකාරය පිළිබඳ අධ්‍යයනය කෙරේ. දූපතක් වශයෙන් ලංකාවේ උතුර, නැගෙනහිර සහ දකුණ යන මුහුදු තීරයන් කිමිදුම් කටයුතු සඳහා සුදුසු වාතාවරණයක පැවතීම සංචාරක ක්ෂේත්‍රයට ලැබී ඇති අද්විතීය අවස්ථාවක් වශයෙන් හැඳින්විය හැකි ය. විශේෂයෙන් මෙම ප්‍රදේශ වටා පවතින නොගැඹුරු මුහුදු තීරය, සාගර ජෛව විවිධත්වය සහ මුහුදු පුරාවිද්‍යා කටයුතු ද අධ්‍යයනය කිරීම කෙරෙහි අවධානය යොමු කෙරේ. මෙහි දී කිමිදුම් සංචරණය ගැඹුරු මුහුදේ කිමිදීම (Scuba Diving) යන අංශය යටතේ ප්‍රවර්ධනය කිරීමට බලාපොරොත්තු වේ. (ඡායාරූපය අංක 1) ශ්‍රී ලංකාව තුළ දියයට උරුමයන් සොයාගැනීමට හා ගවේශණයට අවැසි විශේෂඥ ඥාණය හා පහසුකම් නිර්මාණය වී ඇති මෙවන් යුගයක වටිනා උරුම සංචාරකයන්ට විධිමත් ලෙස ප්‍රවර්ධනය කිරිමට අවධානයක් යොමු නොවීමත්, නිසි ප්‍රතිලාභ ළඟාකරගත නොහැකිවීමත් අභාග්‍යයට කරුණකි. එහෙයින් ශ්‍රී ලංකාවේ උතුර, නැගෙනහිර සහ දකුණ යන ප්‍රදේශයන්හී දියයට පවතින සංස්කෘතික හා ස්වභාවික උරුමයන් රැකගනිමින් සංචාරකයන්ට ප්‍රවර්ධනය කිරීමටත්, ඉන් ලද හැකි ප්‍රතිලාභයන් සහ මේ සම්බන්ධ දැනට පවතින දුබලතා මඟහරවාගෙන විධිමත්

සැලසුමක් නිර්මාණය කිරීමේ අරමුණින් මෙම පර්යේෂණය සිදුකෙරේ. ලංකාව තුළ කිමිදුම් කටයුතු විදේශීය මෙන් ම දේශීය සංචාරකයන් අතර ප්‍රචලිත කිරීමට නම් ඒ සඳහා ක්‍රමවත් වැඩපිළිවෙළක් අවශ්‍ය වේ. මෙහි දී කිමිදුම් සංචරණයේ ඇති විනෝදශීලී බව මෙන්ම ත්‍රාසජනක බව සංචාරකයන් අතර ප්‍රචලිත කිරීම, කිමිදුම් කටයුතු සඳහා වඩාත් සුදුසු ස්ථාන හඳුනාගැනීම කෙරෙහි අවධානය යොමු කෙරේ. කොරල් පර මුලික කරගත් සාගරයේ ජෛව විවිධත්වය (සිතියම් අංක 1) හා ලංකාව වටා මුහුදේ ගිලී ඇති පැරණි නෞකා (සිතියම් අංක 2) පිළිබඳ ව මෙහි දී මූලික අධ්‍යයනයක් කිරීම අදහස වූ අතර සාගරය තුළ ඇති කොරල් පර කිමිදුම් සංචරණයට ලබාදෙන දායකත්වය පිළිබඳවත් විමසා බැලේ.

## ක්‍රමවේදය

මෙම පර්යේෂණයේදී උතුර, නැගෙනහිර සහ දකුණ යන ප්‍රදේශයන් තුළ ජනප්‍රිය කිමිදුම් ගමනාන්ත ආශ්‍රිත ව සංචාරය කරමින් අවශ්‍ය දත්ත එක්රැස් කරන ලදී. එම ප්‍රදේශයන්හී කිමිදුම් සංචාරකයන්ගෙන් ද ප්‍රදේශවාසීන්ගෙන් ද, ගාල්ල මුහුදු පුරාවිද්‍යා ඒකකයේ නිලධාරීන්ගෙන් ද, නාවුක හමුදා නිලධාරීන්ගෙන් ද, වනජීවී දෙපාර්තමේන්තුවේ නිලධාරීන්ගෙන් ද, දියයට කිමිදුම් ක්‍රියාකාරකම් මෙහෙයවනු ලබන ආයතනයන් හා ඒවායේ සේවකයන්ගෙන් ද, පුද්ගලික කිමිදුම්කරුවන් වැනි මෙම ක්ෂේත්‍රයේ නියැලෙන්නන්ගෙන් මෙන් ම සාමාන්‍ය සංචාරකයන් යන පාර්ශවයන් සමඟ සිදුකරන ලද සම්මුඛ සාකච්ඡා හා ඉදිරිපත් කරන ලද ප්‍රශ්නාවලීන් යොදාගනිමින් මේ සඳහා අවශ්‍ය ප්‍රාථමික දත්ත රැස්කරගත් අතර දියයට ආකර්ෂණ සහ උරුමයන් හා සම්බන්ධව ප්‍රකාශයට පත්කර ඇති ලිඛිත ග්‍රන්ථාවලීන්, සඟරා, පුවත්පත් ලිපි හරහා ද්විතීයික දත්ත රැස්කරන ලදී.

## ප්‍රතිඵල හා සාකච්ඡාව

දත්ත රැස්කිරීමේ දී උතුර නැගෙනහිර දකුණ යන ප්‍රදේශයන්හී දියයට සම්පත් පිළිබඳ විදේශීය සංචාරකයින්ගේ දැනුවත්භාවය, කිමිදුම් සංචරණයට සංචාරකයන්ගේ දායකත්වය, මෙම ප්‍රදේශයන් කිමිදුම් සංචරණය සඳහා යොදාගැනීමේ දී වැඩි වශයෙන් ප්‍රමුඛස්ථානයක් ලබාදිය යුතු ප්‍රදේශ කවරේ ද, දියයට සම්පත් ආරක්ෂා කිරීමේදී වැඩි අවධානයක් යොමුකළ යුතු ප්‍රදේශ, ප්‍රදේශයන්හී පවතින දියයට සම්පත් පිළිබඳ ව ප්‍රදේශවාසීන්ගේ දැනුවත්භාවය, කිමිදුම් කටයුතුවල පවතින දුර්වලතාවයන්, කිමිදුම් ක්ෂේත්‍රයේ සංවර්ධනය විය යුතු අංශ, කිමිදුම් කටයුතු සඳහා සංචාරකයින් පැමිණි රටවල්, කිමිදුම් සංචාරකයින්ගේ අරමුණු, කිමිදුම් සංචරණය සඳහා යොමු වන සංචාරකයින්ගේ අධ්‍යාපන මට්ටම, අදාළ ප්‍රදේශයන් හී දියයට ක්‍රියාකාරකම් පිළිබඳ ව සංචාරකයින්ගේ තෘප්තිමත්භාවය යන අංශ පිළිබඳ මූලික අවධානය යොමු කෙරුණු අතර එම දත්ත විශ්ලේෂණය තුළින් වැදගත් කරුණු රැසක් අනාවරණය කර ගැනීමට හැකි විය. එම ප්‍රතිඵලයන්ට අනුව කිමිදුම් සංචාරකයන් ආකර්ෂණය කර ගැනීමේදී වැඩි අවධානයක් යොමුකළ යුතු රටවල් කවරේ ද යන්න අනාවරණය විය. තවද මෙරට කිමිදුම් සංචරණය ප්‍රවර්ධනය සඳහා සැලකිය යුතු මට්ටමෙන් ප්‍රායෝගික වැඩසටහන් විදේශීය රටවල සිදුනොවන බව අනාවරණය වූ අතර දියයට සංචරණය ප්‍රවර්ධනය කිරීමේදී කිමිදුම් ආයතනයන් සහ රාජ්‍ය පාර්ශවයන් හී කාර්යභාරය හඳුනාගත හැකි විය. තවද කිමිදුම් ක්ෂේත්‍රය සංවර්ධනයට එල්ල වී ඇති අයහපත් බලපෑම් හඳුනාගනිමින් සාර්ථක ප්‍රවර්ධන ක්‍රමවේද මඟින් ප්‍රායෝගිකව කිමිදුම් සංචරණ ක්ෂේත්‍රය

තුළ ප්‍රගමනයක් ඇති කළ හැක්කේ කෙසේදැයි හඳුනාගැනීමට හැකි වූ අතර කිමිදුම් සංචරණ වෙළඳපොළ තුළ ශ්‍රී ලංකාවට අභියෝගයක්ව පවතින රාජ්‍යයන් සතු කිමිදුම් සම්පත් හඳුනාගනිමින් පර්යේෂණයට අදාළ ප්‍රදේශයන් තුළ උපක්‍රමශීලිව ඊට ආදේශකයන් හඳුන්වා දී ශ්‍රී ලංකාවට තරගකාරිව කිමිදුම් සංචරණ ක්ෂේත්‍රය ජයගත හැකි ආකාරය පිළිබඳ ව මෙහි දී සාකච්ඡා කෙරේ. ඒ අනුව මෙම පර්යේෂණයේ දී උක්ත දැක්වූ ප්‍රදේශයන් තුළ පවතින ස්වභාවික හා සංස්කෘතික උරුමයන් මෙන් ම එම ප්‍රදේශ ආශ්‍රිත ව හඳුන්වාදිය හැකි නව දියයට උරුමයන් සංචාරක ආකර්ෂණ ලෙස හඳුන්වාදීම, එම උරුමයන් ආරක්ෂා කිරීමට මෙතෙක් රජයෙන් ගෙන ඇති පියවරයන් හා අනාගතයේ ගතයුතු නෛතික පියවරයන්, එම සම්පත් ප්‍රවර්ධනයට රජය හා පෞද්ගලික ආයතනයන්හී කාර්යභාරය විමසීම, එම සම්පත් උපායශීලව ප්‍රවර්ධනය කරමින් කිමිදුම් සංචාරකයන්ගේ ආකර්ෂණය ශ්‍රී ලංකාව වෙත දිනාගැනීමට යොදා ගත හැකි ප්‍රවර්ධන ක්‍රමවේද කවරේදැයි විමසුමට ලක් කෙරේ.

**ආශ්‍රිත ග්‍රන්ථ**


ප්‍රනාන්දු, මනෝ. (2011) ***ලක්දිව සාගර පත්ල.*** සූරිය ප්‍රකාශකයෝ. කොළඹ 10

Silva de Nimal et al. (2013) ***Maritime Heritage Of Lanka (Ancient ports and harbours)***. Central Culture Found. Srilanka

කරුණාරත්න, එම් (2013) *නැගෙනහිර වෙරළ තීරයේ මුහුදු පුරාවිද්‍යා ගවේෂණ.* **දළනිදු විද්‍යුත් පුවත් සරණිය.** 5 වෙළුම. 1 කාණ්ඩය. මුහුදු පුරාවිද්‍යා ඒකකය. ගාල්ල. [ONLINE] Available at: http://mausrilanka.lk. [Accessed 12 August 16].